www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: එල්ටීටීඊයේ පරාජයෙන් වසරකට පසු

**Sri Lanka: One year after the LTTE's defeat**

**2010 මැයි 18**

වසරකට පෙර අද වැනි දිනක, යටත් වීමට උත්සාහ දැරූ ඇතැම් නායකයන් ද ඇතුලුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ඉහල නායකයින් සියලු දෙනා සමූල ඝාතනය කරමින් එහි පාලනය යටතේ තිබූ බිම් තීරුව මිලිටරිය විසින් අවසාන වශයෙන් යටත්කර ගත්තේ ය. එය, දිවයිනේ දෙමල සුලුතරයේ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් පාගා දැමීමටත් කම්කරු පන්තිය බෙදා වෙන් කිරීමටත් පිලිවෙලින් බලයට පත් කොලඹ ආන්ඩු විසින් විසිපස් වසරක් තිස්සේ නිර්දය ලෙස ගෙන ගිය සාපරාධී යුද්ධයක අවසන් අදියර විය.

යුද්ධයේ අවසන් මාස කිහිපයේදී එල්ටීටීඊ සටන්කරුවන් සහ 300,000කට අධික සිවිල් වැසියන් පිරිසක් ඊසාන දිග වෙරල තීරයේ කුඩා බිම් කඩකට කොටුකල මිලිටරිය, කෲර ලෙස ඔවුන්ට කාලතුවක්කුවලින් සහ ගුවනින් ප්‍රහාර එල්ල කලේය. ආන්ඩුව විසින් ප්‍රකාශයට පත්කල "වෙඩි තහනම් කලාපය" තුල සිදුවූ සිවිල් මරන සංඛ්‍යාව 7,000ක් වසයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගනන් බලා තිබින. මැයි 17වෙනි දින නිකුත් කරන ලද ජාත්‍යන්තර අර්බුද නිරීක්ෂන කන්ඩායමේ වාර්තාවක තක්සේරුවට අනුව "දස දහස් ගනන් ගැහැනු, ලමුන්, හා මහලු දෙමල සිවිල් වැසියන් මරා දමා ඇති අතර තවත් නොගිනිය හැකි සංඛ්‍යාවක් තුවාල ලැබූහ. මරන සංඛ්‍යාව තවත් වැඩි කරමින්, ලක්ෂ ගනනකට ප්‍රමානවත් ආහාර සහ වෛද්‍ය පහසුකම් අහිමි කෙරුනි."

පන බේරාගත් අය "සුභසාධන ගම්මාන" හෙවත් කටුකම්බිවලින් වටකරන ලද හා සන්නද්ධ හමුදා භටයන් විසින් මුර කරන මිලිටරි-පාලක සිර කඳවුරුවලට ගාල් කරනු ලැබූහ. මිලිටරියේ ප්‍රශ්න කරුවන් හා ඔත්තුකරුවන් විසින් "ත්‍රස්තවාදී සැකකරුවන්" ලෙස නම්කල දහස් ගනන් දෙමල තරුනයින් හා තරුනියන් "පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට" දක්කනු ලැබූ අතර, ඔවුන් තවමත් ඒවා තුල රඳවා ගෙන සිටියි. දස දහස් ගනන් සිවිල් වැසියන් ද තවමත් කඳවුරුවල රැඳී සිටියි. නිදහස් කරනු ලැබූවන් ආපසු ගොස් ඇත්තේ අඛන්ඩ මිලිටරි ග්‍රහනයක් යටතේ පවතින දිවයිනේ උතුරු හා නැගෙනහිර විශාල සිර කඳවුරකටය.

කිසිදු යුද අපරාධයක් සිදු වී ඇතැයි යන්න එකහෙලා ප්‍රතික්ෂේප කරන ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු, ඒ පිලිබඳව කෙරෙන අංශුමාත්‍ර විවේචනයක් පවා "අන්තර්ජාතික කුමන්ත්‍රනයක" කොටසක් යයි හෙලා දකිති. 20දාට පැවැත්වීමට නියමිත දැවැන්ත මිලිටරි පෙලපාලියකින් අවසන් වන "ජයග්‍රහන" සැමරුම් සඳහා ආන්ඩුව මේ සතිය වෙන් කොට තිබේ. මෙය, ඕනෑම විරුද්ධත්වයක් මැඩීම හා බියගැන්වීම අරමුනු කරගත් යෝධ පොලිස්-රාජ්‍ය යන්ත්‍රනයක් මගින් පටවන ලද මුසාව හා වර්ගවාදය මත ගොඩනගන ලද තන්ත්‍රයකි.

යුද්ධයේ අවසානය, එල්ටීටීඊයේ පරාජයෙන් පසු දිනවල ජනාධිපති රාජපක්ෂ පොරොන්දු වූ "සාමය සහ සෞභාග්‍යය" උගාකර දුන්නේ නැත. දෙමල, මුස්ලිම් සහ සිංහල කම්කරුවන් එකිනෙකා සමග කෙටවීම ඉලක්ක කරගෙන පවත්වාගෙන ගිය නිල දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ දශක ගනනාවකට පසුව, 1983 දී පුපුරා ගිය යුද්ධය සෑම විටම මූලිකව යොමුකරන ලද්දේ කම්කරු පන්තියට එරෙහිව ය. එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව රාජපක්ෂ ප්‍රකාශයට පත්කල "ජාතිය ගොඩනැගීමේ ආර්ථික යුද්ධය" ද ඒ හා සමානව කම්කරු පන්තියට එරෙහිව එල්ල කෙරුනකි.

දිවයින නව ආසියානු ආශ්චර්යයක් බවට පරිවර්තනය කිරීමේ රාජපක්ෂගේ සිහිනය කෙසේ වෙතත්. ශ්‍රී ලංකාව මුහුන දී සිටින්නේ ගැඹුරු ආර්ථික අර්බුදයකට ය. යුද්ධයේ අවසානය 1930 ගනන්වල මහා අවපාතයෙන් මෙපිට දරුනු ම ගෝලීය මූල්‍ය අර්බුදය සමග සමපාත විය. වසර ගනනාවක දැවැන්ත

මිලිටරි වියදම්වල ප්‍රතිඵලය වූ සුවිශාල රාජ්‍ය නය සියලු අපනයනවල පහල වැටීමක් සමග එකට පැමිනියේ ය. ගෙවුම් ශේෂ අර්බුදයකින් ගැලවීම සඳහා ලුනු වතුරෙන් පිපාසය සංසිඳවා ගැනීමට තතනන මිනිසෙක් මෙන් ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) එක්සත් ජනපද ඩොලර් බිලියන 2.6ක නයක් ගත්තේ ය.

ග්‍රීසිය සහ යුරෝපය කේන්ද්‍ර කරගෙන ඇති රාජ්‍ය නය අර්බුදයේ ස්වරූපයෙන් දෙවන වටයට එලැඹී ඇති ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ පොදු වියදම් කපමින්, රාජ්‍ය වත්කම් විකුනා දමමින් සහ බදු බර වැඩි කරමින් ලොවපුරා ආන්ඩු එම අර්බුදයේ බර වැඩකරන ජනයාගේ කරමත හෙලීමට කටයුතු කරමින් සිටිති. ජාමූඅ අවධාරනය කරන්නේ ලබන වසර අවසන් වනවිට ශ්‍රී ලංකාවේ අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක් දක්වා අඩකින් කැපිය යුතු බවයි. කම්කරු පන්තියට එරෙහි රාජපක්ෂගේ "ආර්ථික යුද්ධය" දියත් කරනු ඇත්තේ දෙමල සුලුතරයට එරෙහි මර්දනකාරී පියවරවලට සමාන පියවර සමගිනි.

මෙම සතියේ පැවැත්වෙන මිලිටරිය සහ මිලිටරිවාදය සැමරීම වැඩකරන ජනතාවට කෙරෙන තර්ජනාත්මක අනතුරු ඇඟවීමකි. බලමුලුහරනය කරනවා වෙනුවට සන්නද්ධ හමුදා තර කෙරෙමින් තිබේ. ආන්ඩුව සියලු වෘත්තීය ක්‍රියා තහනම් කිරීම ඇතුලු අත්‍යසාමාන්‍ය බලතල ජනාධිපතිට ලබාදෙන හදිසි නීතිය දිගට ම පවත්වාගෙන යයි. සිය ජීවන තත්වයන් ආරක්ෂා කරගැනීමටත් වැඩිවන බඩුමිල සහ විරැකියාවට එරෙහිවත් සටන් කොට ඇති කම්කරුවන්ට එරෙහිව එවැනි පියවර ගැනීමට රාජපක්ෂ පසුබට වී නැත. පසුගිය වසරේ ඔහු වරාය, තෙල් සංස්ථා, ජලසම්පාදන මන්ඩල හා විදුලිබල මන්ඩල කම්කරුවන් වැටුප් වැඩිවීමක් ඉල්ලා ගෙන ගෙනගිය වෘත්තීය ක්‍රියාමාර්ගය නීති විරෝධී කලේ ය.

දැන් ජනවාරි මාසයේ ජනාධිපතිවරනය සහ අප්‍රේල් මහමැතිවරනය අවසන් වී තිබියදී රාජපක්ෂ ආන්ඩුව, සිය ආර්ථික ප්‍රහාරය තීව්‍ර කිරීමට සූදානම් වෙමින් සිටී. පලමු ඉලක්කය බවට පත්ව ඇත්තේ කොලඹ මධ්‍යයේ ජීවත්වන මුඩුක්කු වාසීන් සහ වෙලෙන්ඳන් ඇතුලත් නාගරික දිලින්ඳන්ගේ වඩාත් ම දුර්වල ස්ථරයයි. සති දෙකකට පෙර දේපොල වෙලෙන්දන්ට තම ලාභ ගරාගැනීමට මාවත හෙලිකරදීම සඳහා පොලීසිය සහ හමුදා හටයෝ පවුල් 45ක් ඔවුන්ගේ නිවාසවලින් එලියට ඇදදමා එම නිවාස විනාශ කරන ලදහ. එහෙත් මෙය හුදෙක් ඉදිරි මාසවල දී නිශ්චිතව ම පුපුරායාමට නියමිත පන්ති අරගලවල මූලික ගැටුමක් පමනි.

මෙයින් නිශ්චිත නිගමන උපුටා ගත යුතු ය. පසුගිය වසරේ දෙමල සිවිල් වැසියන් සංහාරයට ලක්කල ආන්ඩුව කම්කරු පන්තියට එරෙහිව රාජ්‍ය යාන්ත්‍රනය මුලු බලයෙන් යෙදීමට මැලි නො වනු ඇත. විපක්ෂ දේශපාලනඥයන් සහ මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගෙන හෝ සමහර අවස්ථාවල දී මරා දමනු ලැබ ඇතත් එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන විරුද්ධ පක්ෂ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට අසමර්ථව ඇත. මෙම පක්ෂවලට ආන්ඩුව සමග මූලික මතභේදයක් නැත. දක්ෂිනාංශික එජාපය යුද්ධය අරඹා දශකයක් තිස්සේ එය කරගෙන ගිය අතර සිංහල ස්වෝත්තමවාදී ජවිපෙ එම යුද්ධයේ වඩාත් ම දුෂ්ට සහකරුවෙක් විය. පක්ෂ දෙක ම රාජපක්ෂගේ වෙලඳපොල හිතවාදී න්‍යාය පත්‍රය සමග එකඟ ය. ආන්ඩුවේ මෙන් ම විපක්ෂයේ ද වෘත්තීය සමිති සියල්ල කම්කරුවන්ගේ විරුද්ධත්වය සහ කෝපය වාෂ්ප කර යටපත් කිරීමට උදවු කොට තිබේ.

පසුගිය වර්ෂය දෙමල බෙදුම්වාදයේ බංකොලොත්කම ද සනාථකොට තිබේ. දිවයිනේ උතුරේ හා නැගෙනහිරේ වෙනම ධනේශ්වර ඊලම් රාජ්‍යයක් සඳහා වූ වාර්ගික ඉල්ලීම මත පදනම් වූ දේශපාලන ක්‍රියාමාර්ගයෙන් එල්ටීටීඊයේ පරාජය සැදුම් ලද්දේය. ශ්‍රී ලංකාවේ හෝ ජාත්‍යන්තරව කම්කරු පන්තිය වෙත කිසිදු ආයාචනයක් කිරීමට ඓන්ද්‍රීයව ම අපොහොසත් වූ එල්ටීටීඊ නායකත්වය සිය අවසන් මාස කිහිපය ගතකලේ රාජපක්ෂගේ යුද්ධයට පිටුබලය දුන් "ජාත්‍යන්තර ප්‍රජාව" වෙත වඳ ආයාචනා කරමිනි. එල්ටීටීඊයේ හොරනෑව වූ දෙමල ජාතික සංධානය (ටීඑන්ඒ) පසුගිය මැයි මාසයේ සිට කටයුතු කර ඇත්තේ කොලඹ දේශපාලන සංස්ථාපිතයේ ඒ හෝ මේ කන්ඩායම සමග හාමුවීමේ මං සොයමිනි. ජනවාරි මාසයේ පැවති ජනාධිපතිවරනයේ දී ටීඑන්ඒ හි එක් කොටසක් රාජපක්ෂ ආන්ඩුවට කරබදු වූ අතර අනෙක් පාර්ශවය රාජපක්ෂගේ යුද්ධය නිර්දය ලෙස ක්‍රියාවට දැමීමට වගකිව යුතු ජෙනරාල්වරයා වූ සරත් ෆොන්සේකාට සහයෝගය දුන්නේ ය.

ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර කම්කරු පන්තියට මෙහි පුලුල් පාඩම් ගැබ්ව පවතී. ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනය විසින් ලෝකය පුරා ආන්ඩු වෙතින් ඉල්ලා

සිටිනු ලබන දරුනු කප්පාදු පියවරයන් සාමකාමීව හෝ ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාවට දැමිය නො හැක. ප්‍රතිරෝධය හා විරුද්ධත්වය වර්ධනය වෙද්දී ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කෙරෙන පොලිස්-රාජ්‍ය විධික්‍රම වඩ වඩාත් සාමාන්‍ය තත්වයක් බවට පත්වනු ඇත. කම්කරු පන්තියට මෙම ප්‍රහාර පරාජය කලහැකි වන්නේ ධනවත් අතලොස්සකගේ ලාභය නොව වැඩකරන ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම ඉලක්ක කරගත් සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත පාලක ප්‍රභූවේ සියලු කොටස්වලින් ස්වාධීනව බලමුලුගැන්වීමෙන් පමනි. එවැනි ව්‍යාපාරයක් ගොඩනගනු ලැබිය හැක්කේ සියලු ආකාරවල ජාතිකවාදය සහ වර්ගවාදය ප්‍රතික්ෂේප කිරීමෙන් පමනි. ශ්‍රී ලංකාව තුල මෙහි අර්ථය වන්නේ දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තර සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් එක්සත් වීම ය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය සටන් වදින ක්‍රියාමාර්ගය එයයි.

විජේ ඩයස්

**© www.wsws.org**